# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2064/8 - 2018 මාර්තු මස 26 වැනි සඳුදා - 2018.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2) වන වගන්තිය යටතේ වූ නියමයයි**

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කේ. සී. ලෝගේස්වරන් වන මම 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) උප වගන්තිය යටතේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම, සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් මා වෙත පැවරී ඇති බලතල පළාත් සභා පනතේ 32(2) උප වගන්තිය ප්‍රකාරව අංක 01 උපලේඛනයේ සඳහන් කොන්දේසි වලට යටත්ව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2018 ක් වූ අප්‍රේල් මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් පවරා දෙමි. අංක 02 උපලේඛනයේ සඳහන් තනතුරු වලට පත්කිරීමේ බලය බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා සතුය.

විනය බලධාරියාගේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් වන අයෙකුට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත අභියාචනය කිරීමට අයිතිවාසිකම් ඇති බවත් මෙයින් නියම කොට ප්‍රකාශ කරමි.

මෙම බලතල පැවරීම ක්‍රියාත්මක වීමට පෙර දිනෙන් ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීමට අදාළ අංක 1859/32 හා 2014 අප්‍රේල් මස 24 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රය යටතේ පළ කරන්නට යෙදී ඇති 2014 අප්‍රේල් මස 24 දිනැති නියමය ඒ යටතේ ගන්නා ලද කිසිදු ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරන බවද නිවේදනය කරමි.

කේ. සී. ලෝගේස්වරන්,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර.

2018 මාර්තු මස 22 වෙනි දින,
කොළඹ 03,
ගාලුපාර, අංක 109, රොටුන්ඩා ගොඩනැගිල්ල,
5 වන මහලෙහි පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය අංක 01

(අ) බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් හෝ වෙනත් නිලධාරියෙකු විසින් පවරා දෙන ලද බලතල යටතේ ක්‍රියා කරමින් පත්වීම් සිදුකිරීමට පෙර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතු ය.

(ආ) බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් හෝ වෙනත් නිලධාරියෙකු විසින් පවරා දෙන ලද බලතල යටතේ ක්‍රියා කරමින් සේවයේ අවශ්‍යතාවය මත නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ එකඟතාවය ලබාගත යුතු ය.


1A - PG 3960 — 10 (2018/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය අංක 02

| අනු අංකය | වැටුප් කේතය | නිලධාරී ගණය |
|---|---|---|
| 1 | SL - 3 | පළාත් ආණ්ඩුකාර ලේකම් බස්නාහිර පළාත |
| 2 | SL - 3 | පළාත් සභා ලේකම් බස්නාහිර පළාත |
| 3 | SL - 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් |
| 4 | SL - 3 | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් සහ මුදල්, ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පරිපාලන අමාත්‍යාංශ ලේකම් |
| 5 | SL - 3 | පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලප්‍රවාහන හා සංචාරක කටයුතු අමාත්‍යාංශ ලේකම් |
| 6 | SL - 3 | අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් |
| 7 | SL - 3 | කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ ලේකම් |
| 8 | SL - 3 | පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ ලේකම් |
| 9 | SL - 3 | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශ ලේකම් |
| 10 | SL - 3 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11 | SL - 3 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 12 | SL - 3 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 13 | SL - 3 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 14 | SL - 3 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 15 | SL - 1 | පළාත් ආදායම් කොමසාරිස් |
| 16 | SL - 1 | පළාත් පාලන කොමසාරිස් |
| 17 | SL - 1 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 18 | SL - 1 | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ |
| 19 | SL - 1 | පළාත් ඉඩම් කොමසාරිස් |
| 20 | SL - 1 | පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |
| 21 | SL - 1 | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ |
| 22 | SL - 1 | පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් |
| 23 | SL - 1 | පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් |
| 24 | SL - 1 | පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස් |
| 25 | SL - 1 | පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් |
| 26 | SL - 1 | පළාත් නිවාස කොමසාරිස් |
| 27 | SL - 1 | පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ |
| 28 | SL - 1 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 29 | SL - 1 | පළාත් ආයුර්වේද කොමසාරිස් |
| 30 | SL - 1 | පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ |
| 31 | SL - 1 | පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් |
| 32 | SL - 1 | නාගරික කොමසාරිස් - කොළඹ මහා නගර සභාව |
| 33 | SL - 1 | නාගරික කොමසාරිස් - දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව |
| 34 | SL - 1 | නාගරික කොමසාරිස් - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව |
| 35 | SL - 1 | නාගරික කොමසාරිස් - මොරටුව මහා නගර සභාව |
| 36 | SL - 1 | නාගරික කොමසාරිස් - කඩුවෙල මහා නගර සභාව |
| 37 | SL - 1 | නාගරික කොමසාරිස් - ගම්පහ මහා නගර සභාව |
| 38 | SL - 1 | නාගරික කොමසාරිස් - මීගමුව මහා නගර සභාව |
| 39 | SL - 1 | ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 40 | SL - 1 | ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ගෙවීම්/අයවැය/මුදල් හා ආදායම්) |
| 41 | SL - 1 | මානව සම්පත් සංවර්ධන හා කළමනාකරණ පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ |
| 42 | SL - 1 | ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් |

04 - 379

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.